# اليوم الآخر

# අවසාන දිනය

سنهالي


المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد
E.mail : Sultanah22@hotmail.com
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH
Tel:4240077 Fax:4251005 P.O.Box:92675 Riyadh:11663 K.S.A. E-mail: sultanah22@hotmail.com

# اليوم الآخر

أعده وترجمه للغة السنهالية

## شعبة توعية الجاليات بالزلفي

الطبعة الثانية: ١٤٢٢/١

ح المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالزلفي ، ١٤٢٠هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات (الزلفي)
اليوم الآخر - الزلفي.
٢٨ ص ؛ ١٢ × ١٧ سم
ردمك : ٥ - ٦٦ - ٨١٣ - ٩٩٦٠
(النص باللغة السنهالية)
١ . القيامة أ. العنوان
ديوي ٢٤٣ ٢٠/١٦٠٨

رقم الايداع ٢٠/١٦٠٨
ردمك : ٥ - ٦٦ - ٨١٣ - ٩٩٦٠

الصف والإخراج: **شعبة توعية الجاليات بالزلفي**

# أحكام اليوم الآخر

# අවසාන දිනය

ප්‍රශංසා සියල්ල විශ්වය පාලනය කරන අල්ලාහ් තආලාට හිමි වේ. සාමය හා සමාදානය නබිවරුන්ගෙන් හා රසූල් වරුන්ගෙන් ශ්‍රේෂ්ඨවන්තයාවූ නබිනායක මුහම්මදු (සල්) තුමාටද, එතුමාගේ පවුලේ අයටද එතුමාගේ ශ්‍රාවකරුවන්ටද හා අන් සැම දෙනාටද ලැබෙනු මැන.

නිශ්චය වශයෙන්ම ඊමානයෙ(විශ්වාස කිරීමෙ)හි මූලික අංග යන් හයකි. එහි හයවන කරුණවන්නේ අවසාන දිනය පිළිබඳව විශ්වාස කිරීමයි. මෙම දිනය පිළිබඳව අල් කුර්ආනය මගින් හා මුහම්මදු (සල්) තුමාගේ සුන්නා (යහමග) මගින් සනාථකර ඇති දේ විශ්වාස කරනතුරු මිනිසෙකු මුඃමින් (විශ්වාස වන්තයෙකු) නොවන්නේය.

අවසාන දිනය පිළිබඳව දැනගැනීම හා ඒ ගැන අධික ලෙස සිහිකිරීම වැදගත්ය. කුමක්නිසාදයත්, එය මිනිස් සිත්සතන්තුල ගුණ යහපත්කම ඇති කිරීමටත්, ඔහු බිය භක්තිකයෙකු කිරීම ටත්, ඔහු අල්ලාහ්ගේ දහමෙහි ස්ථිරවීමටත් ඉමහත් හේතුදායක වන්නේය. මෙම අවසාන දිනයද, එහි නොසන්සුන්තාවයද හා අසීරුතාවයද නොසිතා අමතකවනු සේ ඔහුගේ හිත ගල්කර, පාප ක්‍රියාවන් කරා යොමු කරන දේ කුමක් විය යුතුද ?. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَوْمًا يَجْعَلُ الْوِلْدَانَ شِيبًا﴾ [المزمل:١٧]

එදින ළදරුවන් (කෙස් පැහුණු) මහල්ලන් කරයි.

*(අල්කුර්ආන්-73:17)*

﴿ يَاأَيُّهَا النَّاسُ اتَّقُوْا رَبَّكُمْ ، إِنَّ زَلْزَلَةَ السَّاعَةِ شَيْءٌ عَظِيْمٌ، يَوْمَ تَرَوْنَهَا تَذْهَلُ كُلُّ مُرْضِعَةٍ عَمَّا ارْضَعَتْ وَتَضَعُ كُلُّ ذَات حَمْلٍ حَمْلَهَا وَتَرَى النَّاسَ سُكَارَى وَمَا هُمْ بِسُكَارَى وَلَكِنَّ عَذَابَ اللهِ شَدِيْدٌ ﴾ [الحج: ١، ٢]

මිනිසුනි, ඔබලාගේ දෙවියා කෙරෙහි බියබැතියෙන් සිටින්න. නියතවශයෙන්ම එම (අවසාන දින) අවස්ථාවේ කම්පනය (ඉතා) විශේෂ සිදුවීමකි. එදින කිරි පොවමින් සිටින සෑම මවකුම තමා කිරි පොවන ළදරුවා අමතක කිරීමද, සෑම ගර්භනී මාතාවන්ම තමන්ගේ බර පිදීමද ඔබ දකී. තවද, මිනිසුන් බුද්ධිය මුලාවී සිටීමද ඔබ දකී. එනමුත්, එය (මත්පැන් වලින් සිදුවූ) මුලාවීමක් නොවන්නේය. නමුත් අල්ලාහ්ගේ දඬුවම ඉතා උග්‍රයි.

*(අල්කුර්ආන් -22:1,2)*

# මරණය

1 – මරණය මෙලොවෙහි ජීවත්වන සෑම දෙනාගේම අවසානය වේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ كُلُّ نَفْسٍ ذَائِقَةُ الْمَوْتِ ﴾ [آل عمران :١٨٥]

සෑම ආත්මයක්ම මරණය (ට ලක්වී) භුක්ති විඳිය යුතුයි.

*(අල්කුර්ආන් -3:185)*

﴿ كُلُّ مَنْ عَلَيْهَا فَانٍ ﴾ [الرحمن :٢٦]

(පොළොවෙහි) ඇති සියල්ලක්ම විනාශවන්නේය.

*(අල්කුර්ආන් -55:26)*

﴿إنك ميت وإنهم ميتون﴾ [الزمر: ٣٠]

(නබිතුමනි) නියතවශයෙන්ම, ඔබද මරනයට පත්වේ. තවද, නියතවශයෙන්ම ඔවුන්ද මරනයට පත්වෙති.

*(අල්කුර්ආන් -39:30)*

එහෙයින්, කිසියම් මිනිසෙකුට හෝ මෙලොවෙහි අමරණීය තත්ත්වයක් නොමැත. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وما جعلنا لبشر من قبلك الخلد﴾ [الأنبياء: ٣٤]

(නබිතුමනි) තවද, ඔබට පෙර කිසියම් මිනිසෙකුට හෝ ස්ථිර ජීවිතයක් අපි (මෙහි) නොදුන්නෙමු. *(අල්කුර්ආන් -21:34)*

මරනය, සැක කිරීමට මගක් නොමැති නිශ්චිත කරුණෙකි. නමුත් මිනිසුන්ගෙන් වැඩි පිරිසක් මේ ගැන අමතකයෙන් සිටිති. එනිසා මුස්ලිම්වරයෙකු මෙලොව විනාශවීමට පෙර පරලොව සඳහා සූදානම්වීම සේ මරනය ගැන වැඩියෙන් සිහි කිරීම හා ඒ සඳහා සූදානම් වීමද අවශ්‍ය වේ. නබි මුහම්මදු (සල්) තුමා පවසන්නේය.

[إغتنم خمسا قبل خمس : حياتك قبل موتك ، وصحتك قبل سقمك، وفراغك قبل شغلك ، وشبابك قبل هرمك ، وغناك قبل فقرك ]

(مسند الإمام أحمد)

(අවස්ථාවන්) පහට පෙර (අවස්ථාවන්) පහක් ප්‍රයෝජනවත් කරන්න. ඔබ, මරනයට පෙර ජීවිත කාලයද, ලෙඩවීමට පෙර නිරෝගී කාලයද, කාර්‍ය බහුලවීමට පෙර විවේක කාලයද, මහලුවීමට පෙර යෞවන කාලයද, දිළිඳුවීමට පෙර ධනවත් කාලයද ප්‍රයෝජනවත් කරන්න.

*(මුස්නද් අහ්මද් ග්‍රන්ථය ඇසුරෙනි)*

දැනගන්න, මළමිනිය සමග මෙලොවේ කිසියම් දෙයක් හෝ මිනීවළ කරා ගෙනියනු නොලැබේ. නිසැකයෙන්ම ඔහු සමග ඉතිරිව (පවති)න්නේ (රැඳී සිටින්නේ) ඔහුගේ ක්‍රියාව පමණී. එබැවින්, ඔබට සතුට ගෙන දෙන හා අල්ලාහ්ගේ අනුමැතිය මත වේදනාවෙන් ජය ලබාදෙන කුසල් ක්‍රියාවන් සූදානම් කිරීමට උනන්දුවිය යුතුයි.

2-මිනිසාගේ ආයුෂ කාලය අල්ලාහ් හැර අන් කිසිවෙකු නොදන්නා ගුප්තවූ කරුණෙකි. එනිසා කිසියම් කෙනෙකු තමා කෙදින, කවර ස්ථානයේ මරණයට පත්වෙන්නේද, යන කරුණු ගැන නොදන්නේය. මක්නිසාදයත්, නිසැකයෙන්ම, මෙය අල්ලාහ් පමණක් දන්නා සැඟවූ කරුණෙකි.

3-මරණය පැමිණිවිට එයට බාධාකිරීම හෝ පමා කිරීම හෝ එය මගහැරමින් පැනදිවීම හෝ කළ නොහැක. අල්ලාහ් මෙලෙස පවසන්නේය.

﴿ وَلِكُلِّ أُمَّةٍ أَجَلٌ، فَإِذَا جَاءَ أَجَلُهُمْ لاَيَسْتَأْخِرُوْنَ سَاعَةً وَّلاَ يَسْتَقْدِمُوْنَ ﴾

[الأعراف:٣٤]

සමාජයේ සැමටම (නිශ්චිත ආයුෂයක්) වාරයක් ඇත. ඔවුන්ගේ වාරය පැමිණෙන විට එය ප්‍රමාද කළ නොහැකිය. තවද, එය පෙරද (සිදු) නොවන්නේය. *(අල්කුර්ආන්-7:34)*

4-විශ්වාස වන්තයෙකුට මරණය සිදුවන්නේද, (එමොහොතේදී) ඔහු වෙත මලකුල් මව්ත් (පණ ගන්නා සුරදූත) වරයා මිහිරි සුවඳ සෞන්දර්යමත් රූපයෙන් පැමිණේ. ඔහු සමග ස්වර්ගය ගැන සුභාරංචි පතන කරුණාවන්ත මලක්වරුද පැමිණෙති. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿إن الذين قالوا ربنا الله ثم استقاموا تتنزل عليهم الملائكة ألا تخافوا ولاتحزنوا وأبشروا بالجنة التي كنتم توعدون ﴾ [فصلت : ٣٠]

කවරෙකු එස දෙවියා අල්ලාහ් බව ප්‍රකාශ කර, (එහි) ස්ථිර පැවැත්මෙන් සිටින්නේද, නිසැකයෙන්ම ඔවුන් වෙත මලක් වරුන් පැමිණ 'ඔබලා බිය නොවන්න, කණගාටු නොවන්න, ඔබලාට පොරොන්දුවූ ස්වර්ගය ගැන සතුටු වන්න' යනුවෙන් පවසති. *(අල්කුර්ආන්-41:30)*

නමුත්, ප්‍රතික්ෂේප කරන්නෙකුට මරණය සිදුවන්නේද, ඔහු වෙත මලකුල් මවුත් (පණ ගන්නා සුරදූත) වරයා දුගද ඇඳුම් පැළඳ තද කලු මුහුණෙන් බිය ජනක රූපයෙන් පැමිණේ. ඔහු සමග වේදනාව ගැන සුභාරංචි (අවවාදය) පතන මලක් වරුන්ද පැමිණෙති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿ولو ترى إذ الظالمون في غمرات الموت والملائكة باسطوا أيديهم، اخرجوا أنفسكم ، اليوم تجزون عذاب الهون بما كنتم تقولون على الله غير الحق وكنتم عن آياته تستكبرون ﴾ [الأنعام : ٩٣]

අපරාධකරුවන් මරණ වේදනාවට ලක්ව සිටිම ඔවුහු දකින් නේද, මලක්වරුන් තම දෑත් දික්කරමින් 'ඔබලාගේ පණ පිට කරන්න, අද දින ඔබලාට නින්දා දෙන වේදනාව කුලිය වශයෙන් ලැබේ. මක්නිසාදයත්, ඔබලා අල්ලාහ් ගැන ව්‍යාජ කරුණු ප්‍රකාශකර සිටිහ. තවද, ඔහුගේ වැකි (අවිශ්වාසකර) අහංකාර කරමින් සිටිහ' යනුවෙන් පවසති.

*(අල්කුර්ආන්-6:93)*

එබැවින්, මරණය සිදුවන විට සත්‍ය එළිවෙන අතර, මිනිසුන් සැමටම කරුණු පැහැදිලිවේ. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿حتى إذا جاء أحدهم الموت قال رب ارجعون، لعلي اعمل صالحا فيما تركت كلا ، إنهاكلمة هو قائلها ، ومن ورائهم برزخ إلى يوم يبعثون﴾

[المؤمنون: ٩٩،١٠٠]

ඔවුන්ගෙන් කෙනෙකුට මරණය සිදුවන විට ඔහු 'මගේ දෙවි යනේ, මා (ලොවෙහි) ඇර ආ දේයින් කුසල් ක්‍රියා කිරීම සඳහා මාව නැවත (ලොව කරා) හරවා එවන්න'. යනුවෙන් පවසයි. කරුණු එසේ නොවේ. ඔහු පවසන්නේ (අසත්‍ය) ප්‍රකාශයයි. නැගිට්ටවන දිනය තෙක් ඔවුන් ඉදිරියේ තිරයක් තිබේ.

*(අල්කුර්ආන්-23:99,100)*

එබැවින්, මරණය සිදුවන විට ප්‍රතික්ෂේප කරන්නා (කාෆිර්) හා පාප කාරයා කුසල් ක්‍රියාවෙහි යෙදීම සඳහා මෙලොව කරා නැවත ඒම අපේක්ෂා කරයි. නමුත් මෙලොව අතපසු වීමෙන් පසු කණගාටුවීමෙන් (කිසිදු) පලක් නොවන්නේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿وترى الظالمين لما رأوا العذاب يقولون هل إلى مرد من سبيل﴾

[الشورى: ٤٤]

තවද, අපරාධකරුවන් වේදනාව දකිනවිට (මෙයින්) වැළකී සිටීමට මගක් තිබේද? යනුවෙන් පැවැසීම ඔබ දකී.

*(අල්කුර්ආන්-42:44)*

5-දාසයා පිළිබඳව අල්ලාහ්ගේ කරුණාව. එනම්, මරණයට පෙර කවරෙකුගේ අවසාන ප්‍රකාශය 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' බවට

පවතියේද, ඔහු ස්වර්ගයෙහි පිවිසේ. මේ බව නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[من كان آخر كلامه من الدنيا لا إله إلا الله دخل الجنة]

(أخرجه أبو داود)

මෙලොවෙහි කවරෙකුගේ අවසාන ප්‍රකාශය 'ලා ඉලාහ ඉල් ලල්ලාහ්' යනුවෙන් පවතින්නේද, ඔහු ස්වර්ගයට පිවිසේ.
*(අබුදාවුද් ග්‍රන්ථය ඇසුරෙනි)*

චිත්ත පාරිශුද්ධ වන්තයා හැර අන් මිනිසෙකුට මෙම උවදුර අවස්ථාවේ මෙම කලිමාව පැවැසීමට නොහැක. චිත්ත පාරිශුද්ධිය නොවන්නා මරණ කලබලයෙහි ඔහුට සිදුවන අසීරුතාව යන් මත මෙම කලිමාව පැවැසීමෙන් වැළැකී සිටී. එහෙයින්, මරණය සිදුවන මොහොතේ ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් කියා දීම සතුටුදායකවේ.

# කබ්ර් - මිනීවළ

මුහම්මදු (සල්) තුමා මිනීවළ පිළිබඳව මෙසේ පවසන්නේය.

[إن العبد إذا وضع في قبره وتولى عنه أصحابه،إنه ليسمع قرع نعالـــهم ، قال: فيأتيه ملكان فيقعدانه فيقولان له: ماكنت تقول في هـــذا الرجـــل ؟ قال: فأما المؤمن فيقول: أشهد أنه عبدالله ورسوله، قال فيقال له : أنظـــر إلى مقعدك من النار قد أبدلك الله به مقعدا في الجنة . قال صلى الله عليـــه وسلم : فيراهما جميعا . وأما الكافر أو منافق فيقال له ماكنت تقول فــــي هذا الرجل؟ فيقول : لا أدري ، كنت أقول ما يقول الناس، فيقـــال : لا

دريت ولا تليت ، ويضرب بمطارق من حديد ضربة ، فيصيـــــح صيحـــة يسمعها من يليه إلا الثقلين] (سنن النسائى)

කෙනෙකු මිනීවළෙයෙහි තැන්පත්කර, ඔහුගේ මිත්‍රයන් ඔහු හැර යනවිට ඔවුන්ගේ පාවහන්හි නාදය ඔහුට ඇසේ. එවිට එහි පැමිණෙන මලක්වරුන් දෙන්නෙක් ඔහුව වාඩිකරවා (කෙනෙකු පෙන්වමින්) මෙම මිනිසා පිළිබඳව ඔබ කුමක් ප්‍රකාශ කරමින් සිටියේද ? යනුවෙන් ඔහුගෙන් අසති. එවිට විශ්වාස වන්තයා, ඔහු අල්ලාහ්ගේ දාසයා හා දූතයා බව සාක්ෂි පැතූ බව පවසයි. අපායයෙහි ඔබේ ආසනය (ස්ථානය) බලන්න. නිසැකයෙන්ම, අල්ලාහ් ඔබේ ආසනය ස්වර්ගයට මාරු කළාය යනුවෙන් ඔහුට පැවැසේ. ඔහු එම ආසන දෙකම බලා සිටී.

තවද, අවිශ්වාස වන්තයා හෝ මුනාෆික් (කුහක) වරයාගෙන් මේ මිනිසා පිළිබඳව ඔබ කුමක් ප්‍රකාශ කරමින් සිටියේද? යනුවෙන් විමසේ. ඔහු, මා නොදනිමි. මිනිසුන් ප්‍රකාශකළ දේම මාද ප්‍රකාශ කරමින් සිටියෙමි යයි පවසයි. එවිට 'ඔබ දැනගත්තේද, පිළිපැද්දේද නොමැත. යනුවෙන් ඔහුට පැවැසේ. තවද, ඔහුට යකඩ (තලන ලොකු) මිටියෙන් පහරක් දෙනු ලැබේ. එවිට ඔහු කෑකෝ ගසයි. ඒ ශබ්දය මිනිස් හා ජින් වර්ගයන් හැර අන් සියලු දෙනාටම ඇසේ.

මිනීවළෙහි දේහයට නැවත පණ පෙවීම පරලොව පිළිබඳ හා මෙලෝ මිනිස් නුවණට නොවටහන කරුණකි. මිනිසා ත්‍යාග යට සුදුසු විශ්වාස වන්තයා වන්නේනම්, මිනීවළෙහිද ඔහු ත්‍යාග ලබයි. ඔහු වේදනාවට සුදුස්සෙකු වන්නේනම්, මිනීවළෙහිද ඔහු වේදනාව ලබයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නෙනන්ය.

﴿النار يعرضون عليها غدوا وعشيا، ويوم تقوم الساعة ، ادخلوا آل فرعون أشد العذاب﴾ [غافر:٤٦]

උදේ හා සවස ඔවුන් අපායයෙහි ගින්න ඉදිරියට ගෙනෙනු ලැබේ. තවද, විනිශ්චය කිරීම සිදුවන අවසන් දිනයේ (වේලාවේ) 'ෆිර්අවුන්ගේ කල්ලිය දැඩි දඬුවමට ලක් කරන්න' (යනුවෙන් පැවසේ) *(අල්කුර්ආන් -40:46)*

නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[ تعوذوا بالله من عذاب القبر] (أخرجه أبو داود)

මිනීවළෙහි වේදනා පිළිබඳව අල්ලාහ්ගෙන් රැක වරණය පතන්න. *(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)*

නිවැරදි බුද්ධිය (ඇත්තෙකු) මෙය (මිනීවළ වේදනාව) ප්‍රතික්ෂේප නොකරයි. මන්දයත්, මිනිසා තම ජීවිතයේද මෙය සමීපව දකී. එනම්, නින්දයෙහි පසුවන්නා තමා දැඩි වේදනාවට ලක්වන බව (සිහිනයෙන්) හැඟී කැකෝ ගසා රැකවරණය පතයි. මරණය හා ජීවිතය අතර විශාල වෙනසක් තිබෙන අතර, ඔහු අසලෙහි සිටින්නාට මෙය නොහැඟෙන්නේය. මිනීවළෙහි වේදනාව පණට හා දේහයට (එකට) සිදුවේ. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[القبر أول منازل الآخرة ، فإن نجا منه فما بعده أيسر منه ، وإن لم ينج منه فما بعده أشد منه] (أخرجه الترمذي)

මිනීවළ පරලොවෙහි නවා තැන්වලින් ප්‍රථම තැනකි. මෙයින් කෙනෙකු ජය ලබන්නේනම්, ඔහුට මින් පසු සිදුවන දේ මෙයට

වඩා පහසුවේ. මෙයින් කෙනෙකු ජය නොලබත්තේනම්, ඔහුට මින් පසු සිදුවන දේ මෙයට වඩා අපහසුවේ.

*(තිර්මිදි ග්‍රන්ථය ඇසුරෙනි)*

එබැවින්, මුස්ලිම්වරයෙකු මිනීවළෙහි වේදනාවෙන් (ජය ලබා ගැනීමට) අධික වශයෙන් රැකවරණය පැතීම අනිවාර්යවේ. විශේෂ යෙන්, නැමදුමෙහි සලාම් කීමට පෙර රැකවරණය පැතිය යුතුයි. එසේම මිනීවළ හා නිරයෙහි වේදනාවට මූලික කාරණයන් වන පාප ක්‍රියාවලින් ඈත් වීමට ඇල්ම විය යුතුයි. මෙයට මිනීවළ වේදනාව යනුවෙන් හැඳින්වන්නේ, මිනිසුන්ගෙන් වැඩි පිරිසක් මිනීවළෙහි භූමිදානය කිරීම නිසාය. එසේ නොවන අය එනම්, දියට ගිලී ගිය අය, ගින්නට දැවුනු අය, සතුන් (හපා) කාපු අය හා මෙවැන්නන් පරලොවෙහි ත්‍යාග හෝ වේදනාව ලැබේ.

මිනීවළ වේදනාව විවිධ ආකාරයෙන් සිදුවේ. එය යකඩ වැනි (ලොකු) මිට්යෙන් පහර දීම, ඔහුගේ මිනීවළය අන්ධකාරයෙන් පිරීම, නිරයේ ඇතිරිල්ලක් ඔහුට දිගහැරීම, නිරයේ දොරටුවක් ඔහුට විවෘත කිරීම, ඔහුගේ අකුසල් (ක්‍රියා) දුගඳ ඇඳුම් පැළඳ පිළිකුල් මුහුණු වරයකින් යුත් මිනිසෙකුගේ රූපයෙන් ඔහු හා සමග වාඩිවීම යනාදිය වේ.

දාසයා කාෆිර් හෝ මුනාෆික් හෝ වන්නේද, වේදනාව ස්ථිර යෙන් පවතී. දාසයා පාපකාර මුඃමින් වන්නේනම්, එවිට ඔහුගේ පාප ක්‍රියාවන් අනුව වේදනාවන්ද වෙනස්වේ. (පසුව) ඔහු එයින් නිදහස්වේ. දාසයා මුඃමින් වන්නේනම්, ඔහු මිනීවළයෙහි දයාව ලබයි. එනම්, ඔහුගේ මිනීවළය විශාල කෙරේ. එය ආලෝක යෙන් පිරේ. ස්වර්ගය කරා ඔහුට දොරටුවක් විවෘතවේ. එමගින් ඔහුට සුගන්ධය ලැබේ. ස්වර්ගයේ ඇතිරිල්ලක් ඔහුට දිගහැරේ. ඔහුගේ කුසල් ක්‍රියා සෞන්දර්ය මිනිසෙකුගේ රූපයෙන් මිනී වළෙහි ඔහු හා සමග කතා බහ කරයි.

# අවසාන දිනය හා එහි සළකුණු

1-අල්ලාහ් මෙලොව ස්ථිරව පැවැත්වීම සඳහා නිර්මානය කළේ නැත. එහෙයින්, එයට අවසාන දිනයක් ඒවි. එය විනිශ්චය ලබා දෙන දිනයකි. මෙය සත්සුදක්සේ සත්‍යයකි. අල්ලාහ් මේ බව මෙසේ පවසනන්නේය.

﴿وأن الساعة آتية لاريب فيها﴾ [الحج:٧]

නිසැකයෙන්ම, පරලොව (වේලාව) පැමිණේ. මෙහි කිසියම් සැකයක් නොමැත. *(අල්කුර්ආන්-22:7)*

﴿وقال الذين كفروا لا تأتينا الساعة، قل بلى وربي لتأتينكم﴾ [سبأ:٣]

තවද, කාෆිර්වරුන් '(විනිශ්චය කරන පරලොව) වේලාව අපට නොපැමිණේ' යනුවෙන් පවසති. (නබිතුමනි) 'මාගේ දෙවියා මත දිවුරා කියමි. (එසේ නොවේ) නිශ්චය වශයෙන්ම (එය) ඔබලා වෙත පැමිණේ'. යනුවෙන් ඔබ පවසන්න.

*(අල්කුර්ආන්-34:3)*

අවසාන දිනය සමීපයෙන් පවතින බව අල්ලාහ් පහත සඳහන් වැකි මගින් මෙසේ පවසනන්නේය.

﴿إقتربت الساعة﴾ [القمر:١]

(අවසාන) වේලාව සමීපව පැමිණ ඇත. *(අල්කුර්ආන්-54:1)*

﴿إقترب للناس حسابهم وهم في غفلة معرضون﴾ [الأنبياء:١]

මනුෂ්‍යයන්ට මවුන්ගේ ගණන් බැලීම (ප්‍රශ්න කිරීම) සමීපව පවතී. එනමුත් මවුන් එය (ප්‍රතික්ෂේප කරමින්) නොසළකා සිටිති. *(අල්කුර්ආන් -21:1)*

අවසාන දිනය සමීපව තිබීම මිනිස් බුද්ධියෙන් දැනගැනීමක් නොවේ. එය මවුන් දැන ගැනීමටද නොහැක. නමුත් අල්ලාහ් ගේ ඥානය හා ලොවෙහි ගෙවීගිය කාලය අනුව අනුමාන කළ හැකිය. අවසාන දිනය පිළිබඳ දැනුමනම්, එය අල්ලාහ් තම ඥානයෙන් හිමිකරගත් සැඟවූ කරුණකි. මහු තම නිර් මානවලින් කිසිවෙකුට හෝ මෙය පැහැදිළි නොකළේය. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

﴿يسألك الناس عن الساعة ، قل إنما علمها عند الله ، وما يدريك لعل الساعة تكون قريبا﴾ [الأحزاب:٦٣]

(නබිතුමනි, විතිශ්චයට අයත්) එම වේලාව පිළිබඳව මිනිසුන් මබෙන් අසති. ඒ පිළිබඳ ඥානය අල්ලාහ් සතුව ඇති බව මබ පවසන්න. එය මබ දැන සිටින්නේද ? එය සමීපයෙන් පැමිණී මටද හැක. *(අල්කුර්ආන් -33:63)*

නබි මුහම්මදු (සල්) තුමා අවසාන දිනය සමීපයෙන් පැවැතීම පිළිබඳ සළකුණු (කීපයක්) පවසන්නේය.

මසීහුද් දජ්ජාල් පිටවීම හා එමගින් මිනිසුන් ඉමහත් නොසන් සුන්තාවයට පත්වීමද මෙයින් එකකි. මිනිසුන්ගෙන් අධික පිරිස් රැවැටෙන අන්දමට (සාමාන්‍ය පැවැත්ම නොවන) ආශ් චර්ය කාර්යයන් කිරීම සඳහා අල්ලාහ් මහුට ශක්තිය ලබා දෙයි. මහු වැහි වැසීම සඳහා අහසට අණ කරයි. අහස වස්ස වයි. (පැලෑටි වර්ග) පැලවීම සඳහා (පොළොවට) අණ කරයි.

එය පැලවේ. මළ අය ජීවත් කරවයි. තවද, මෙවැනි වෙනත් ආශ්චර්ය කාර්යයන්ද ඔහු කරයි.

නබි මුහම්මදු (සල්) තුමා ඔහු ගැන මෙලෙස පවසන්නේය. ඒක නෙතයෙන් සිටින ඔහු ස්වර්ගය හා අපාය ගෙන එයි. ඔහු ස්වර්ගය යනුවෙන් පවසන්නේද, එය අපායවේ. ඔහු අපාය යනුවෙන් පවසන්නේද, එය ස්වර්ගයයි. ඔහු පොළෝ වෙහි දින හතලිහක් (40) රැඳී සිටී. එහි එක් දිනයක් එක් වසරක් සේද, තවත් දිනයක් එක් මාසයක් සේද, තවත් දින යක් එක් සතියක් සේද, ඉතිරි දිනයන් සාමාන්‍ය දිනයන් වශ යෙන්ද පවතී. පොළොවෙහි මක්කාව හා මදීනාව හැර ඔහු නොගැවෙසන කිසියම් ස්ථානයක් නොඉතිරිව පවතී.

ඊසා (ජේසුස්) නබිතුමා සුහහ් නැමදුම වේලාවෙ ඩමස්කස් ප්‍රදේශයේ ධවල මනාරාව (ගෝපුරය) මත බැස ඒමද අවසන් දිනය පිළිබඳ සළකුණුවලින් එකකි. මිනිසුන් සමග සුහහ් සලාතය ඔහු ඉටුකරයි. පසු ඔහු දජ්ජාලය සොයා මරා දමයි. ඉර බටහිරෙන් උදාවීමද අවසාන දිනයේ සළකුණක්ය. මෙය දකින මිනිසුන් මැව්ලි විශ්වාස කරති. මෙම විශ්වසයෙන් ඔවුන්ට කිසියම් පලක් නොවන්නේය. අවසාන දිනය පිළිබඳ වෙනත් සළකුණු කීපයක් ඇත.

2–පාපකාර මිනිසුන් සඳහා අවසාන දිනය සිදුවේ. අවසාන දිනය සිදුවීමට පෙර අල්ලාහ් සුවඳ මඳ සුළඟක් එවයි. එම සුළඟ විශ්වාස වන්තයින්ගේ පණ අත්පත් කරයි. අල්ලාහ් මරනය හා මෙලොව අවසන් කිරීම මගින් මැවීම් කෙරෙහි තීරණයක් ගැනීමට අදහස් කරන්නේනම්, එවිට ඔහු සූර්හි පිඹින ලෙස (අදාල) මලක් (සුරදූත) වරයාට අණ කරයි. (සූර් යනු මහා අඟකි) එම නාදය අසන මිනිසුන් මුළාවේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿ونفخ في الصور فصعق من في السموات ومن في الأرض إلا من شاء الله﴾ [الزمر:٦٨]

සූර්හි පිඹනලද විට අල්ලාහ් කැමැති අය හැර, අහසෙහි හා පොළොවෙහි සිටින්නන් සිහිය නැතිව මූළාවෙති.

*(අල්කුර්ආන්-39:68)*

අවසන් දිනය සිකුරාදා දිනක සිදුවේ. පසු සැම මලක්වරුන්ම මරණයට පත්වේ. අල්ලාහ් හැර අන් කිසියම් දෙයක් හෝ ඉතිරිව නොපවතී.

3-මිනිස් ශරීරයේ 'අජ්බුදනබ්' හැර අන් සියල්ලම විනාශවී එය පොළොව අනුභව කරයි. (අජ්බුදනබ් යනුවෙන් හැඳින්වන්නේ මූලමයයි. එය මිනිසාගේ පිට දණ්ඩ අවසානයේ ඇති ඇටකටුවකි) නියත වශයෙන්ම නබි (වක්තෘ) වරුන්ගේද පරිත්‍යාගශීලීන් (ෂහීද්වරුන්)ගේද දේහයන් පොළොව අනුභව නොකරයි. අල්ලාහ් අහසෙන් ජලය ඉසා (විනාශවූ) ශරීරයන් වර්ධනය කරයි. අල්ලාහ් මිනිසුන් නැගිට්ටවීමට අදහස් කරනවිට ඔහු සූර් පිඹීම භාර ඉස්රාෆීල් මලක්වරයාට පණ ලබාදෙයි. එතුමා දෙවැනි වරට සූර්හි පිඹයි. එවිට අල්ලාහ් සියලුම මැවීම්වලට පණ ලබාදෙයි. එවිට මිනිසුන් ප්‍රථමයෙන් පාවහන් නොපැළඳ, නිර්වස්ත්‍රයන් හා චර්මඡේදය (කත්නා) නොකර අල්ලාහ් මැවූ සේ ඔවුන් තම මිනීවළෙහි සිට පිටත්වෙති. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

﴿ونفخ في الصور فإذاهم من الأ جداث إلى ربهم ينسلون﴾ [يس :٥١]

තවද, සූර් හි පිඹන ලද්දේද, ඔවුහු වහාම සමාධි වලින් (මිනී වළෙන්) පිටත්ව තම දෙවියා කරා සීඝ්‍ර වෙති.

*(අල්කුර්ආන්-36:51)*

﴿يوم يخرجون من الأ جداث سراعا كأنهم إلى نصب يوفضون، خاشعة أبصارهم ترهقهم ذلة ، ذالك اليوم الذى كانوا يو عدون﴾

[ المعارج: ٤٣،٤٤]

නිශ්චය වශයෙන්ම, ඔවුන් (තමන් පූජා කරන) මායිම් ගල් කරා සීඝ්‍රයෙන් යන්නන් සේම එදින සමාධිවල සිට සීඝ්‍රයෙන් පිටත්වෙති. ඔවුන්ගේ බැල්ම බිම් බලා තිබේ. නින්දාව ඔවුන් පරිවරා (වටා) ගෙනේ. මෙය ඔවුන්ට පොරොන්දුවූ දිනය වේ. *(අල්කුර්ආන්-70:43,44)*

මෙම පොළො තලය පැලී (පිපිරී) එමගින් ප්‍රථමයෙන් පිටත් වන්නේ නබි මුහම්මදු (සල්) තුමාය. මේ බව එතුමා මගින් අනාවරණයවී ඇත. පසුව මිනිසුන් මහ්ෂර් පිටියට ගෙනෙනු ලැබේ. එය මහා විශාලවත් පොළොවෙකි. කාෆිර්වරුන් එහි මූණින්තලාවයෙන් රැස්කෙරේ. (මූණින්තලාවයෙන් කෙසේ රැස්කරනු ලබන්නේද? යනුවෙන් නබි තුමාගෙන් විමසූහ. එවිට එතුමා 'ඔවුන්ව පාදයෙන් ඇවිද්දවූ තැනැත්තා මූණින්තලාවයෙන් ඇවිද්දවීමටද ශක්ති වන්තයාය' යනුවෙන් පැවැසිය) තවද, අල්ලාහ් සිහිකිරීම උදාසීන කරන්නා අන්ධයා ලෙසද නැගිටිවේ.

එදිනයේ ඉර මැවිල්ලයන් සමීපව සිටී. මැවිල්ලයන් ඔවුන්ගේ ක්‍රියාවන්හි ප්‍රමාණය අනුව දහඩියෙන් සිටිති. ඔවුන්ගෙන් විලුඹ දක්වාද, ඉණ දක්වාද දහඩියෙන් සිටින අයද, මුළු ශරීරයම දහඩියෙන් ගිලා බැසී සිටින අයද සිටිති. අල්ලාහ්ගේ සෙවන හැර අන් කිසි සෙවණැල්ලක්ද නොමැති එම දිනයේ ඔහුගේ සෙවණැල්ල ලබන අයද සිටිති. නබි මුහම්මදු (සල්) තුමා මේ ගැන මෙලෙස පවසන්නේය.

[سبعة يظلهم الله في ظله يوم لا ظل إلا ظله : إمام عادل ، وشاب نشأ في طاعة الله، ورجل معلق قلبه في المساجد، ورجلان تحابا في الله اجتمعا عليه وتفرقا عليه ، ورجل دعته إمرءة ذات منصب وجمال فقال إني أخاف الله ، ورجل تصدق بصدقة فأخفاها حتى لا تعلم شماله ما أنفقت يمينه ، ورجل ذكر الله خاليا ففاضت عيناه] (رواه مسلم)

අල්ලාහ්ගේ සෙවණැල්ල හැර කිසියම් සෙවණැල්ලක් හෝ නොමැති එම දිනයේ අල්ලාහ් හත් දෙනකුට (පමණක්) තමාගේ සෙවණැල්ල ලබා දෙයි. ඔවුන්, යුතුකමින් ක්‍රියා කළ නායකයාද, අල්ලාහ්ට අවනත වීමෙහි නිරතවූ තරුණයාද, මස්ජිදය (දේවස් ථානය) කරා තම සිත යොමුකර සිටින මිනිසාද, අල්ලාහ් වෙනු වෙන් ආදරය කර ඒ සඳහා එක්වූ හා ඒ සඳහා වෙන්වූ දෙන්නාද, උසස් වංශයෙන් හා සෞන්දර්යයෙන් යුත් ස්ත්‍රියෙක් නරක ක්‍රියා වක් සඳහා ආරාධනා කළ විට 'මා අල්ලාහ් කෙරෙහි බියට පත්වූ වෙමි' යනුවෙන් පවසා (වැළකී) සිටි මිනිසාද, තම දකුණ අතින් කරන දානය (පිං) තම වම අත නොදැන පරිදි සැඟවූ මිනිසාද, තනිවම සිට (අල්ලාහ් කෙරෙහි සිහි කිරීමෙන්) නෙත දෙක හි කඳුලු හැලූ මිනිසාද යන්නන්ය.

*(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

මෙය පිරිමින් හට පමණක් නොවේ. ස්ත්‍රීන්ද ඔවුන්ගේ ක්‍රියා වන් වෙනුවෙන් ප්‍රශ්න කෙරේ. එය කුසල් වන්නේනම් කුසලද, (ත්‍යාගද) අකුසල වන්නේනම් අකුසලද (වේදනාද) ලබති. කුලිය දීම හා ප්‍රශ්න කිරීම පිරිමින්ට සේම ස්ත්‍රීන්ටද පවතී. පනස් දහස් වසරකට සමාන මෙම දිනයේ මෙහි (මහ්ෂර්හි)දී මිනිසුන් අධික ලෙස පිපාසවී සිටිති. නමුත් විශ්වාස වන්තයෙකුට (මෙම දිනය) එක සලාතයක් ඉටු කරන වේලාව සේ සීඝ්‍රයෙන් පවතී.

විශ්වාස වන්තයින් නබි නායක තුමාගේ පොකුණට (හවිල්) පැමිණ, එයින් ජලය පානය කරති. (හවිල් යනුවෙන් හැඳින්වන්නේ, අල්ලාහ් නබි නායක තුමාට පමණක් විශේෂ කළ ශ්‍රේෂ්ඨ පොකුණෙකි. එතුමාගේ සමාජයින් අවසාන දිනයේ මෙහි ජලය පානය කරති. මෙම ජලය කිරියට වඩා තදම සුදය. මී පැණියට වඩා රසය. කපුරුවට වඩා සුවඳය. එහි භාජන අහසේ තරුවන් ගේ සංඛ්‍යාවෙකි. මෙම පොකුණෙන් වරක් ජලය පානය කරන්නාට කිසිදා පිපාසයක් ඇති නොවන්නේය.)

මිනිසුන් මහ්ෂර් පිටියේ දීර්ග කාලයක් රැඳී සිට ඔවුන් අතර ප්‍රශ්න කිරීම හා තීන්දු කිරීම අපේක්ෂා කරමින් සිටිති. ඔවුන් අධික උෂ්ණයෙන් හා අසීරුතාවයෙන් සිටින අතර, එහි රැඳී සිටීමද, අපේක්ෂාවද දීර්ගවේ. එවිට මැවිල්ලයන් අතර තීන්දු කිරීමට අල්ලාහ් වෙත නිර්දේශ කරන්නන් සොයා යති. ඔවුන් නබි ආදම් (අලෛ) තුමා වෙත පැමිණේ. එතුමා තමාගේ නොහැකි භාවය පවසයි. පසු නූහ් (අලෛ), ඉබ්‍රාහීම් (අලෛ), මූසා (අලෛ) හා ඊසා (අලෛ) යන නබි තුමානන් වෙත (නිර්දේශ කිරීම සඳහා) පැමිණෙති. එතුමන්ලාද තමතමන්ගේ නොහැකිභාවය පවසති.

පසුව (අවසාන වශයෙන්) නබි මුහම්මදු (සල්) තුමා වෙත පැමිණෙති. එතුමා මෙයට තමා සුදුස්සා බවට පවසා (පිළිගෙන) අර්ෂයේ අභියස සුජූදයෙහි යෙදී සිටී. අල්ලාහ් එතුමාට පහළකළ පරිදි අල්ලාහ්ව සම්පූර්ණ වශයෙන් ප්‍රශංසා කරයි. එවිට අල්ලාහ් 'මුහම්මදු (සල්) තුමනි, ඔබේ හිස ඔසවන්න. ඔබ අයැද සිටින්න. එය ඔබට ලැබේ. ඔබ නිර්දේශ කරන්න, එය පිළිගෙනේ.' යනුවෙන් පවසා විනිශ්චය කිරීමට හා ප්‍රශ්න කිරීමට අල්ලාහ් අවසරය (අණ කරයි) ලබාදෙයි. ප්‍රථමයෙන් ප්‍රශ්න කිරීමට ලක්වන්නේ මුහම්මදු (සල්) තුමාගේ උම්මත් (සමාජයින්)ය.

දාසයාගේ ක්‍රියාවලින් ප්‍රථම වශයෙන් ප්‍රශ්න කරනු ලබන්නේ සලාතය (නැමදුම) ගැනය. එය සතුටුදායකව පිළිගනු ලබන්නේ නම්, අන් ක්‍රියාවන් ගැන අවධානය යොමුකෙරේ. එය (සලාතය) ප්‍රතික්ෂේප වන්නේනම්, ඔහුගේ සියළුම ක්‍රියාවන්ද ප්‍රතික්ෂේප කෙරේ. තවද, දාසයා කරුණු පහක් ගැන ප්‍රශ්න කරනු ලැබේ. එවා, ඔහු තම ගැවූ ආයුෂ කාලය කෙසේ ගත කළේද, තම ගැවූ යෞවනය කෙසේ පල කළේද, තම ධනය කෙසේ රැස් කළේද, එය කෙසේ වියදම් කළේද, තමා ලද දැනුම් ඥානයෙන් කුමන ක්‍රියා කළේද යනාදියන්ය.

තවද, දාසයන් අතර ප්‍රථමයෙන් ප්‍රශ්න කරනු ලබන්නේ ලේ (ඝාතන හා තුවාල කිරීම් වැනි කාර්යයන්) ගැනය.

එදිනයේ පළිගැනීම් සිදුකරනු ලබන්නේ, කුසල් හා අකුසල් ක්‍රියාවන් මගිනි. මිනිසෙකුගේ කුසල් ඔහුගෙන් පීඩනයට ලක් වූවන්ට පිරිනමනු ලැබේ. ඔහුගේ කුසල් අවසන් වූයේනම්, පීඩන යට ලක්වූවන්ගේ අකුසල් ඔහුට පිරිනමනු ලැබේ. පසු සිරාතය පිහිටේ. (එය කෙස් ගහට වඩා සිහිදුයි, කඩුවට වඩා තියුණුයි. එය නිරය මත පිහිටේ) මිනිසුන් තමන්ගේ ක්‍රියාවන් අනුව එය පසුකර යති. ඔවුන්ගෙන් ඇසිපිය ගැසීමේ මොහොතේද, සුළඟ වේගයෙන්ද, අධි සීඝ්‍රයෙන් දුවන අශ්වයන් සේද, බඩ ගෑමෙන්ද සිරාතය පසු කරන්නන්ද සිටිති, එහි මත ඇති දම්වැල් මිනිසුන් අල්ලා නිරයට විසි කරයි. එවිට කාෆිර්වරු හා අල්ලාහ් සිතන පාපකාර මු:මින්වරුන් නිරයෙහි වැටෙති. නිසැකයෙන්ම, කාෆිර් වරුන් නිරයේ ස්ථිරව පසුවෙති. පාපකාර මු:මින්වරු අල්ලාහ්ගේ මතය පරිදි වේදනාවට ලක්වීමෙන් පසු ස්වර්ගයට පිවිසෙති.

ඒකදේවවාදීන් අතර අපායට නියමවූවන් වෙනුවෙන් නිර්දේශ කිරීම සඳහා අල්ලාහ් තමා කැමැතිවූ නබි හෙවත් වක්තෘවරුන්

වද, රසූල් හෙවත් දූත වරුන්ටද හා සාලිහීන් හෙවත් යහපත් ශීලයන්ටද අවසරය ලබා දෙයි. ඒ අනුව නිර්දේශ කරනලද අය අල්ලාහ් නිරයත් පිටමං කරයි. සිරාතය පසුකර යන්නන් එනම්, ස්වර්ගවාසීන් ස්වර්ගය හා නිරය අතර ඇති පාලමෙහි රැඳී සිටිති. එහි පිරිසක් තවත් පිරිසක් මගින් පළිගැනීමට ලක්වනු ලැබේ. කෙනෙකු තම සහෝදරයෙකුට කළ අපරාධය සඳහා පළිගෙන එමගින් ඔහු තෘප්තිවන තෙක් ස්වර්ගයට පිවිසීමට නොහැක.

ස්වර්ග වැසියන් ස්වර්ගයටද, අපාය වැසියන් අපායටද පිවිසී මෙන් පසු මරණය එළුවෙකුගේ රූපයෙන් ගෙනවිත් ස්වර්ගය හා අපාය අතර කපනු ලැබේ. මෙය ස්වර්ගය හා අපාය වැසියන් දුටුවමින් සිටිති. පසු 'ස්වර්ග වැසියනි, (ඔබලා) නිරන්තරයෙන් සිටින්න.(ඔබලාට) මරණය නොමැත' යනුවෙන්ද, 'අපාය වැසියනි, (ඔබලා) නිරන්තරයෙන් සිටින්න. (ඔබලාටද) මරණය නොමැත' යනුවෙන්ද පැවැසේ. කවරෙකු ප්‍රීතියෙන් මරණයට පත්වන්නේද, ඔහු ස්වර්ග වැසියාය. කවරෙකු දුකෙන් මරණයට පත්වන්නේද, ඔහු අපාය වැසියාය.

# අපාය හා එහි වේදනාව

මේ පිළිබඳව අල්ලාහ් තආලා මෙසේ පවසන්නේය.

﴿فاتقوا النار التي وقودها الناس والحجارة ، أعدت للكافرين﴾ [البقرة:٢٤]

මිනිසුන් හා ගල් දවන ද්‍රව්‍යවූ අපායේ ගින්න කෙරෙහි බියව සිටින්න. එය (අල්ලාහ් ඔහුගේ ධර්ම ග්‍රන්ථ ප්‍රතික්ෂේප කරන) කාෆිර්වරුන්ටම සූදානම්කර තිබේ. *(අල්කුර්ආන්-2:24)*

නබි (සල්) තුමා තම ශ්‍රාවකරුවන්ට මෙසේ පැවැසිය.

[ناركم هذه التي توقدون جزء من سبعين جزءا من نار جهنم] قالوا : والله إن كانت لكافية يارسول الله ، قال : [فإنها فضلت بتسع وستين جزءا كلها مثل حرها] (رواه البخاري ومسلم)

නබි මුහම්මදු (සල්) තුමා තම ශ්‍රාවකරුවන්ට 'ඔබලා දල්වන මෙම ගින්න, ජහන්නම් යන නිරයෙහි ගින්නෙන් හැත්තෑවෙන් එක පංගුවෙකි'. යනුවෙන් පැවැසීය. එවිට ඔවුහු නබිතුමානෙනි, මෙය (වේදනා කිරීමට) ප්‍රමාණවත්වේ යනුවෙන් කීහ. එයට නබි තුමා 'නියත වශයෙන්ම මෙය (නිරයේ ගින්න) හැට නවය පංගු වෙන් වැඩිකර ඇත. ඒ සියල්ලම මෙවැනි උණුසුම්ය.' යනුවෙන් පැවැසීය.

අපාය මහල් ප්‍රසාද හතකින් යුත්තෙකි. සෑම මහල්ලක්ම අනෙක් මහල්වලට වඩා අසීරු වේදනා සහිතකි. එයින් සියළුම මහල්වලම තම තමන්ගේ ක්‍රියාවන් අනුව වේදනාවට සුදුස්සන් සිටිති.

මුනාෆික් වරුන් පහළම මහලෙහි සිටිති, මෙය දැඩි වේදනා සහිතකි. කාෆිර්වරුන්ට නිරයෙහි වේදනාව අඛණ්ඩව හා ස්ථිරව පවතී. නමුත්, වේදනාව අධිකව ලබාදීම සඳහා ඔවුන් නිරයේ දැවූ සෑම අවස්ථාවෙහිම නැවත පෙර තත්ත්වයට ගෙනෙනු ලැබේ.

අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿كلما نضجت جلودهم بدلناهم جلودا غيرها ليذوقوا العذاب﴾ [النساء:٥٦]

ඔවුන් වේදනාව (සම්පූර්ණයෙන්ම) අනුභව කිරීම සඳහා ඔවුන් ගේ හම ගැවියන අවස්ථාවෙහි එය නොවන වෙනත් හම් ඔවුන් ට මාරුකරමින් සිටින්නෙමු. *(අල්කුර්ආන් -4:56)*

﴿والذين كفروا لهم نار جهنم ، لايقضى عليهم فيموتوا ولايخفف عنهم من عذابها،كذلك نجزى كل كفور ﴾ [فاطر:٣٦]

ප්‍රතික්ෂේප කරන්නන්ට නිරයේ ගින්න ඇත. ම... දකින ආකාරයට ඔවුන්ගේ කාර්යයන් අවසන් නොක... නිරයේ ඔවුන්ගේ වේදනාවද පහසුකරනු නොලැබේ. මෙලෙ... සෑම කාෆිර්වරුන්ටම අපි කුලිය ලබා දෙන්නෙමු.
*(අල්කුර්ආන්-35:36)*

ඔවුන් එහි විලංගු කෙරේ. ඔවුන්ගේ බෙල්ලටද විලංගු කරනු ලැබේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

﴿وترى المجرمين يومئذ مقرنين فى الأصفاد ، سرابيلهم من قطران وتغشى وجوههم النار﴾ [إبراهيم :٤٩، ٥٠]

තවද, එදිනයේ අපරාධකරුවන් දම්වැල්ලෙන් බැඳ සිටීම ඔබ දකී. ඔවුන්ගේ ඇඳුම් තාරවලින් (කීල් තෙල්) සාදා තිබේ. තවද, ඔවුන්ගේ මුහුණු ගින්නෙන් දවනු ලබයි. *(අල්කුර්ආන්-14:49,50)*

අපාය වැසියන්ගේ ආහාරය ජක්කුම් ගසකි. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

﴿إن شجرت الزقوم طعام الأثيم، كالمهل يغلى فى البطون كغلى الحميم﴾
[الدخان :٤٣، ٤٤]

නිසැකයෙන්ම, ජක්කුම් ගස පාපකරුවන්ගේ ආහාරයෙකි. එය උණුකරනලද තඹ සේ තිබේ. කුසෙහි එය උණුවූ ජලය සේ උණුවේ. *(අල්කුර්ආන්-44:43,44)*

නබි මුහම්මදු (සල්) තුමාද මේ ගැන මෙසේ පවසන්නේය.

[لو أن قطرة من الزقوم قطرت في دار الدنيا لأفسدت على أهـــــل الدنيا معايشهم فكيف بمن يكون طعامه ؟] [سنن الترمذي]

ජත්තුම් ගසෙන් බිංදුවක් ලොවෙහි වැටෙන්නේද, ලොව වැසියන්ගේ ජීවිතය විනාශවේ. එසේනම්, එය ආහාරය වන අයගේ තත්ත්වය කෙසේ පවතීද ?. *(තිර්මිදී ග්‍රන්ථය ඇසුරෙනි)*

නිරයෙහි අසිරු වේදනාව හා ස්වර්ගයෙහි භාග්‍යයේ විශේෂත්වය පිළිබඳව නබි මුහම්මද් (සල්) තුමාගේ වැකියක් මෙසේ අනාවරණයවේ.

[ يؤتى بأنعم أهل الدنيا من الكفار في النار غمسة ثم يقال له: هل مـــر بك نعيم قط ؟ فيقول : لا ، ما مر بي نعيم قط. نسي كل نعيم الدنيـــا وترفها من غمسة واحدة في النار ، كذلك يؤتى بأبأس أهل الدنيا مــــن المؤمنين فيغمس في الجنة غمسة ، ثم يقال له : هل مر بك بؤس قـــط ؟ فيقول: لا، ما مر بي بؤس قط ولا أذى. نسي كل ما قاساه في الدنيا مـــن البؤس والفقر والشقاء من غمسة واحدة في الجنة] (رواه مسلم)

මෙලොවෙහි සම්පූර්ණ භාග්‍යයෙන් ජීවත්වූ කාෆිර් වරයෙකු ගෙනෙනු ලැබේ. ඔහු නිරයේ (ගින්නේ) වරක් ගිල්වනු ලැබීමෙන් පසු ඔහුගෙන් 'ඔබට (ලොවෙහි) කිසියම් භාග්‍යයන් තිබුණේද ?' යනුවෙන් ඇසේ. මාහට කිසියම් භාග්‍යයන් නොතිබුණු බව ඔහු පවසයි. නිරයේ වරක් ගිල්වීමෙන් ඔහුට ලොවෙහි භාග්‍යයන් සියල්ල අමතකවිය.

එසේම, මෙලොවෙහි ඉතාමත් අසීරුතාවයට ලක්වූ විශ්වාස වන්තයෙකු ගෙනෙනු ලැබේ. ඔහු වරක් ස්වර්ගයෙහි ගිල්වීමෙන් පසු ඔහුගෙන් 'ලොවෙහි ඔබට කිසියම් අසීරුතාවයන් තිබුණේද? යනුවෙන් විමසේ. මාහට කිසියම් අසීරුතාවයන් හෝ දුෂ්කරතාව යන් නොතිබුණු බව ඔහු පවසයි. ස්වර්ගයෙහි වරක් ගිල්වීමෙන් ඔහුට ලොවෙහි සිදුවූ අසරණකම, දිළිඳුකම හා අභාග්‍ය සියල්ලම අමතකවිය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

# ස්වර්ගයෙහි ස්වභාවය

ස්වර්ගය අල්ලාහ්ගේ යහපත් දාසයන්ගේ කීර්තිමත් ස්ථිර නිවසකි. එහි කිසියම් ඇසක් නොදුටු, කිසියම් කණක් නොඇසූ හා කිසියම් මිනිස් සිතෙන් වර්ණනා නොකළ භාග්‍යයන් තිබේ. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿فَلَا تَعْلَمُ نَفْسٌ مَّا أُخْفِيَ لَهُم مِّن قُرَّةِ أَعْيُنٍ ، جَزَاءً بِمَا كَانُوا يَعْمَلُونَ﴾

[السجدة:١٧]

ඔවුන් කළ (යහපත්) ක්‍රියාවන් සඳහා ත්‍යාග වශයෙන් (ලබා දීමට) සඟවා ඇති නෙත් පිනවීම (පරලොව මෝක්ෂය) කිසියම් කෙනෙකු නොදනී. *(අල්කුර්ආන්-32:17)*

ස්වර්ගයේ ස්වභාවය මු:මින් වරුන්ගේ ක්‍රියාවන් අනුව උස් පහත්ව පවතී. අල්ලාහ් මෙසේ පවසන්නේය.

﴿يَرْفَعِ اللَّهُ الَّذِينَ آمَنُوا مِنكُمْ وَالَّذِينَ أُوتُوا الْعِلْمَ دَرَجَاتٍ﴾ [المجادلة : ١١]

ඔබලා අතර සිටින විශ්වාසීන්ගේද දැනුම් ඥානය ලද අයගේද තරාතිරම අල්ලාහ් උසස් කරයි.

*(අල්කුර්ආන්-58:11)*

ස්වර්ග වැසියන් තම සිත්සතන් ප්‍රිය කරන දේ එහි අනුභව හා පානය කර සිටිති එහි පාට නොවෙනස්වන ගංගාවන්ද, රස නොවෙනස්වන කිරි ගංගාවන්ද, පවිත්‍ර මී පැනි ගංගාවන්ද සහ පානය කරන්නන්ට තෘප්තිය ගෙනදෙන මද්‍ය පාන ගංගාවන්ද එහි පිහිටා ඇත. එම මද්‍ය පානය මෙලොවෙහි මද්‍ය පානය සේ නොවන්නේය. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

﴿يطاف عليهم بكأس من معين ، بيضاء لذة للشاربين، لا فيها غول ولاهم عنها ينزفون﴾ [الصافات:٤٥-٤٧]

පිරිසිදු පානයෙන් පිරී භාජන ඔවුහු වටකරගෙන ඒවි. (එය) තද සුදය. පානය කරන්නන්ට මිහිරි රසය. එයින් (කිසිදු) බාධා වක් නොමැත. තවද, මෙයින් ඔවුන් බුද්ධි නොසන්සුන්තාවයටද නොපසුවෙති. *(අල්කුර්ආන්-37:45-47)*

එහි 'හූරුල් ඊන්' කන්‍යාවන් විවාහ කර දෙනු ලැබේ. නබි මුහම්මදු (සල්) තුමා මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

[لو أن إمرءة من أهل الجنة إطلعت على أهل الأرض لأ ضاءت ما بينهما – أي السماء والأرض – ولملأ ته ريحا] [رواه البخاري]

ස්වර්ගවාසීන්ගේ කන්‍යාවන් කෙනෙක් ලොව වැසියන් කරා පැමිණෙන්නේනම්, ඇය අහස හා පොලොව අතර ආලෝකමත් කර, සුගන්ධයෙන් පුරවයි.

*(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි)*

ස්වර්ග වැසියන්ගේ ඉමහත් භාග්‍ය වන්නේ, අල්ලාහ්ව බැහ දැකීමයි. තවද, ඔවුන් එහි මලමූත්‍රා පහ කිරීම, නාහය සීරීම හා කෙළ ගැසීම යනාදීන් නොකරති. ඔවුන්ගේ පනාව රත්රන් වශ

යෙන්ද, ඔවුන්ගේ දහඩිය කස්තුරි වශයෙන්ද පවතී. මෙය ඌනවී මක් හෝ විසන්ධිවීමක

ᴾ හෝ නොවන ස්ථිර භාග්‍යයන්ය. නබි මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

[مَنْ يَدْخُلِ الْجَنَّةَ يَنْعَمْ لاَ يَبْأَسْ لاَ تَبْلَى ثِيَابُهُ وَلاَ يَفْنَى شَبَابُهُ]

(رواه مسلم)

කවරෙකු ස්වර්ගයට පිවිසෙන්නේද, ඔහුට භාග්‍යය ලැබෙන අතර, දුර්භාග්‍යය නොලැබෙන්නේය. ඔහුගේ ඇඳුම් පැළඳුම් දිරා පත් නොවන අතර, ඔහුගේ යෞවනයද විනාශ නොවන්නේය. *(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)*

ස්වර්ග වැසියන්ගේ අවම භාග්‍යය, මෙම ලොව දස වතාවක් ලබා දීමට වඩා උතුම්ය. මෙසේ ලබන්නා අපායෙන් සිට අවසානව පිටත්ව ස්වර්ගයට පිවිසෙන තැනැත්තාය.

මහා කරුණික හා අති දයාන්විත අල්ලාහ්, අප සැම දෙනාටම මෙම උතුම්වූ භාග්‍ය හා දායාදයන් ලබා දෙනු මැනවි.

وصلى الله على نبينا محمد وعلى آله وصحبه وسلم،

والحمد لله رب العالمين.

مطبعة النرجس التجارية
NARJIS PRINTING PRESS
تلفون : ٢٣١٦٦٥٣ / ٢٣١٦٦٥٤
فاكس : ٢٣١٦٨٦٦ الرياض

# أخي الكريم وأختي الكريمة

ندعوكم للمشاركة في إنجاح أعمال المكتب وتحقيق طموحاته من خلال إسهامكم بالأفكار والمقترحات والدعم المادي والمعنوي.

## فلا تحرم نفسك الأجر بالمشاركة في دعم أعمال المكتب

## الدال على الخير كـ... فاعله

| م | إسم الحساب | رقم الحساب | غرض الحساب |
|---|---|---|---|
| ١ | التبرعات العامة | ١٩٥٦٠٨٠١٠١٠٢٠٠٧ | خاص بتسيير أعمال المكتب كمثل رواتب الدعاة والعاملين وخدمات أخرى |
| ٢ | تبرعات المكتب | ١٩٥٦٠٨٠١٠١٠٦٥٥٢ | خاص بطباعة الكتب والمطويات وغيرها |
| ٣ | تبرعات الزكاة | ١٩٥٦٠٨٠١٠١٠٨١٣٧ | خاص بأصناف الزكاة |
| ٤ | مقر المكتب | ١٩٥٦٠٨٠١٠١٣٣٥٥٦ | خاص بتشييد مباني المكتب |

الحساب الموحد لجميع [illegible]) لدى مصرف الراجحي


المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف [illegible] ناسوخ [illegible] ص ب [illegible] الرياض ١١٦٦٢ بريد إلكتروني E.mail : Sultanah22@hotmail.com



ردمك: ٥-٦٦-٨١٣-٩٩٦٠


005013